


# ජීවිතේ සුන්දරයි, පින්වතුනි!

අන්තර්ගතය ලෙස වැඩි දෙයක් නොමැති, මේ කතාව කොතනින් පටන් ගන්නදැයි සිතා ගැනීමට මට තරමක කාලයක් ගත විය. අන්තර්ගතය කෙටි වුවද, මේ කතාවේ පසුබිම් විස්තරය ද, කතාව පිළිබඳව කළ හැකි විශ්ලේෂණ ද දීර්ඝ වෙන්නට ඉඩ ඇත. මේ වසර 1976 පමණ කාලයයි. එකල ලෝකයේ බොහෝ රටවල් මෙන්ම ලංකාවේ තිබුණේ ද සංවෘත ආර්ථිකයකි. අද ප්‍රධාන විදේශ විනිමය උපයන මාර්ගයන් වෙන මැද පෙරදිගට ශ්‍රමය ආනයනය කිරීම මෙන් ම, ආනයනය සඳහා කෙරෙන නිමි ඇඳුම් කර්මාන්තයද රට ආගන්තුක ඒවා විය. සම්ප්‍රදායානුකූල ආනයන භාණ්ඩ වූ තේ, පොල්, රබර් වැනි කෘෂි නිෂ්පාදන විකුණා ලැබෙන විදේශ විනිමය සීමා සහිත විය. එනිසා ම, ආනයන සීමා කර තිබුණු අතර ආහාර ඇතුළු සෑම පාරිභෝගික භාණ්ඩයක් ම පාහේ දේශීයව නිෂ්පාදනය කිරීම රටේ ආර්ථික ප්‍රතිපත්තිය විය. මේ නිසා ලංකාවේ පාරිභෝගික භාණ්ඩ, විශේෂයෙන් ම ආහාරපාන, හිඟයක් ඇති වී තිබුණි.

අඩු ආදායම් ලබන්නන් බොහෝ දෙනෙකු ප්‍රධාන වශයෙන් ම යැපුනේ රට පුරා පිහිටුවා තිබුණු විවිධ සේවා සමූපකාර සමිති මගින් සෑම ගමකම පාහේ රජයේ අනුග්‍රහය මත පවත්වාගෙන ගිය සමූපකාර වෙළඳසැල් හරහා සහන මිලට ලබා දුන් සහල් ඇතුළු වියළි ආහාර සලාකය මතයි. සාමාන්‍ය ස්ථිර ආදායමක් තිබූ පහළ මධ්‍යම පන්තිකයින් පවා මේ සහනාධාරවලින් පිහිට ලැබූහ. ඒ රජයෙන් ලබා දුන් සහනාධාර සඳහා උපයෝගී කර ගැනුණු ප්‍රධාන මෙවළම් දෙකක් විය. ඒවා නම්, කූපන් පොත නොහොත් සහල් සලාක පත්‍රය සහ සලාක ක්‍රමය යටතේ බෙදා හරිනු ලැබූ වෙනත් විවිධ පාරිභෝගික භාණ්ඩ සඳහා උපයෝගී කර ගැනුණු සමූපකාර කාඩ් එක යනුවෙන් හැඳින් වුණු දෙවන සලාක පත්‍රයකි. සෑම ලාංකිකයෙකු ම සහල් සලාක පතක සාඩම්බර හිමිකරුවෙකු වූ අතර, සමූපකාර කාඩ් එකක් එක් පවුලකට එකක් වශයෙන් ලැබුණි. ඒ සමගම වසර 1972-1975 පමණ කාලයේ දී එක් අයෙකුට, එක් දිනකට පාන් ගෙඩියකින් (ගෙඩියක් යනු කුණුහරුපයක් නොවේ!) කාලක් සලාක ක්‍රමයට මිලට ගත හැකි, පාන් සලාක පතක් ද භාවිතයේ තිබුණි.

සහන මුදලට ලබා දුන් නියමිත සහල් ප්‍රමාණය මිලට ගැනීමට, සහල් සලාක පත රැගෙන සමූපකාර වෙළඳසැලට යා යුතු විය. එහි දී, සලාක පතේ මුද්‍රණය කර තිබුණු කූපනයක් කතුරකින් කපා ඉවත් කර ගනු ලැබේ. මේ කූපන් සමූපකාර වෙළඳ සහායකයා විසින් පාප්ප ගා විශාල පෝරමවල අලවා විගණන කටයුතු සඳහා සූදානම් කරනු මා දැක ඇත.
සාමාන්‍ය වෙළඳසැලක සහල් කිලෝවක මිල, සමූපකාරයේ සහන මිලට වඩා වැඩි නිසා, මේ කූපනයක යම් කිසි මූල්‍යමය වටිනාකමක් තිබුණි. ඒ නිසා, වසර මුල දී බෙදා හරින කූපන් විශාල ප්‍රමාණයක් ඇතුළත් සලාක පත්‍රයට ද තරමක වටිනාකමක් තිබුණි. දරිද්‍රතාවයේ ගිලුණු ඇතැම් පවුල් සතු වටිනාකමකින් යුතු එකම භාණ්ඩය වූයේ මේ සලාක පත්‍රයයි.

මධ්‍යම පන්තියේ පහළ ස්ථරවල අය පවා තම ස්වර්ණාභරණ උගස් කර හදිසි අවශ්‍යතාවයන් සඳහා මුදල් සොයා ගැනීම අද ද සිදුවෙන්නකි. ඒ වෙනුවට එදා දිළින්දන් උගස්කරුවන් ළඟට ගියේ තමන් ගේ සහල් සලාක පත්‍රය රැගෙන ය.
සහල් සලාක පත්‍ර උගසට ගෙන මුදල් ලබා දෙන පොලී මුදලාලි ලා ගම්වල බිහිවී සිටියහ. එය ස්වයං රැකියාවක් ලෙස ද සැලකිය හැක. මේ කියන කාලයේ හාල් පොතක් උගස් කර ඒ සඳහා ලබා ගත හැකි මුදල වූයේ රුපියල් දහයක් යැයි සිතමි.

උගස් ණය සඳහා ගමේ පොලී මුදලාලිට ගෙවිය යුතු පොලිය වූයේ සියයට දහයකි. ශ්‍රී ලංකා මහ බැංකුව තමන් විසින් ණයට ගන්නා මුදල්වලට ගෙවන අධික පොලී අනුපාතික හා සලකා බලන කළ මේ සියයට දහයක් යන්න ඉතා සාධාරණ අගයක් යැයි ඔබට සිතෙන්නට ඉඩ තිබේ.
නමුත් එය සත්‍යය නොවේ. මෙහි සියයට දහයක් යන්නෙන් අදහස් කෙරෙනුයේ වාර්ෂික පොලිය නොව මසක පොලියයි. එනම්, ඔබ රුපියල් සියයක් ණයට ගතහොත්, ඒ සඳහා මසකට රුපියල් දහයක් පොලිය ලෙස ගෙවිය යුතුවේ. වසරකට පොලිය රුපියක් 120 කි, එනම්, සැබෑ පොලී අනුපාතිකය 120% ක් වේ. මීට අමතරව කෙදිනක හෝ ණය මුදල ද ආපසු ගෙවිය යුතු වේ.

හාල් පොතක වටිනාකම සහ ප්‍රයෝජනය ගැන මා අසා ඇති සුන්දරම කතාව මෙසේ ය.



එවකට අප පදිංචිව සිටි නිවසට නුදුරුව පිහිටි මුර මඩුවක් බඳු කුඩා නිවහනක තරුණ යුවලක් ඔවුන් ගේ කුඩා දරුවා සමග විසූහ. සැමියා එදිනෙදා වැටුපට සේවය කරන කම්කරුවෙකි. ඉතා ළාබාල වියේ පසුවූ බිරිඳ කුඩා දරුවා සමග කාලය ගත කළා ය. මට මතක හැටියට, මේ තරුණිය ප්‍රේම සම්බන්ධයක් මත හදිසියේම විවාහ වී ඇත්තේ පාසල් යමින් සිටියදී ම ය.
පෙර කී සැමියා ගේ නැගණිය මගේ මව ගේ හිතවතියකි. ඇය එක් සෙනසුරාදාවක සවස් වරුවේ අපේ නිවසට ගොඩ වැදුණේ සිය සොහොයුරා හමුවීමට පැමිණි අතරතුර දී ය.

"අයියලා අද උදේ ගම්පහ ගිහින් චිත්‍රපටියක් බලන්න ඇය කීවා ය. දන්නවද ඒ ගොල්ලෝ ඒක කරලා තියෙන හැටි?"

"ඇයි මොකක්ද කරලා තියෙන්නේ?" මගේ මව ඇසූ ප්‍රශ්නයට ලැබුණු පිළිතුර අප සිත් කරුණු ගණනාවක් දෙසට යොමු කරවනු ඇත.

"අයියා ගේ හාල් පොත උගස් කළා ලූ රුපියල් දහයකට. ඒකෙන් තමයි ගම්පහ යන්න කෝච්චියටයි, චිත්‍රපටිය බලන්නයි ටිකට් අරගෙන තියෙන්නේ. ඉතුරු සල්ලිවලින් ගෙදර එන කොට පාන් ගෙඩියක් (ගෙඩියක් යනු කුණුහරුපයක් නොවේ) අරගෙන ඇවිල්ලා සම්බෝලයක් හදාගෙන කාලා!"

මේ දවස්වල දෙවෙනි පන්තියේ සිනමා ප්‍රවේශ පත්‍රයක් රුපියලයි ශත පනස් පහකි. ගනේමුල්ලේ සිට ගම්පහට දුම්රිය ටිකට් පත ශත හතළිහකි. පාන් ගෙඩියක් රුපියක් තුනක් පමණ විය. තරුණ යුවළට චිත්‍රපට දර්ශනයේ විවේක කාලයේ දී රටකජු කන්නටත්, පොඩි දරුවාට ටොෆියක් කන්නටත් හැකි වෙන්නට ඇත.

ඒ සුලු සිදුවීම ඇතුළේ අපට සියයක් කාරණා පෙනේ. මට නම් ඉන් වැදගත් ම කාරණය වන්නේ, කෙතරම් නැති බැරිකම් තිබුණා ද, මේ තරුණ යුවළ, ඒ සියල්ල මදකට හෝ අමතක කර ජීවිතය විඳගත් එඩිතර ආකාරයයි.

ජීවිතේ කෙතරම් සුන්දරද, පින්වතුනි?




